පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 492

ආයතනයේ නම : අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4)

යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வினா இலக்கம் 492

நிறுவனத்தின் பெயர்: கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு

பாராளுமன்றத்தில் அரச கணக்குகள் தொடர்பான செயற்குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரது அவதானிப்புக்கள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் குறித்த விபரங்களை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No : 492

Name of the institution : Ministry of Education, Higher Education and Vocational Education

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No .119(4)

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - 492

ආයතනයේ නම - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අනු අංකය	පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492 වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩු පාඩු	ආයතනය විසින් අඩු පාඩු නිවැරදි කරගැනීම සඳහා ගනු ලැබූ පියවරයන්ට අදාළ වර්තමාන තත්ත්වය
01.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් යොමු කරනු ලබන විගණන විමසුම් පිළිතුරු ලබා ගැනීමට, අදාළ පාසල්වලට, පළාත්වලට සහ අංශවලට යොමු කළ යුතුය. බොහෝ විට එක් විගණන විමසුමක විවිධ අංශවල කොටස් අනතර්ගත වේ. එවිට එක් විගණන විමසුමක් අංශ කිහිපයකට යොමු කරනු ලබයි. එක් අංශයක් එක් කොටසකට හෝ පිළිතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එම විගණන විමසුමට පිළිතුරු සැපයීමට අපහසු වේ. එබැවින් මසක් ඇතුළත පිළිතුරු සැපයීමට අපහසු වුවත් හැකි උපරිම ආකාරයෙන් විගණන විමසුම් වලට කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ.
02.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	පිළිතුරු ප්‍රමාද වන අවස්ථාවලදී සිහි කැඳවීම් ලිපි යොමු කිරීමටත්, පාසල්වලින් පිළිතුරු ප්‍රමාද වන්නේ නම්, ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත අධ්‍යක්ෂ (ජාතික පාසල්) හරහා සිහි කැඳවීමටත්, තව දුරටත් පිළිතුරු ප්‍රමාද වන විට, පාසලක නම් විදුහල්පති හෝ වෙනත් අංශයක නම් අංශ ප්‍රධානියා අභ්‍යන්තර විගණන අංශයට කැඳවීමටත්, එසේත් නොමැති අවස්ථාවල අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු වාර්තාවට ඇතුළත් කිරීමටත් පියවර ගෙන ඇත.
03.	මූ.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	2023 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්මෙහි පිටපත් 2023.01.27 දින රජයේ විගණන අංශය වෙත යොමු කර ඇත. අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (Annual Implementation Plan) හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම (Annual Procurement Plan) ඇසුරෙන් අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කෙරේ. ඒ අනුව එම වාර්තාවන් සකස් කර අවසන් වී මෙම අංශය වෙත ලැබෙන තෙක් අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් කල නොහැක.

04.	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2023 වර්ෂයට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පහත දිනවලදී පවත්වා ඇත. 2023.01.17 2023.05.03 2023.09.06 2023.12.06
05.	2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මූ.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මසක් තුල ක්‍රියාත්මක කර ඒ බව වාර්තා කිරීමට කටයුතු කරන ලෙස විද්‍යා පීඨ හා ගුරු විදුහල් දැනුවත් කර ඇති අතර නිර්දේශ ක්‍රියාත්මක නොකරන ආයතන සඳහා පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.
06.	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	KE – 6357 දරණ ජීප් රථය හැර අනෙක් සියලු වාහනවල අයිතිය මේවන විට පවරාගෙන අයිතිය තහවුරු කරන ලිපි ලබාගෙන ඇති අතර මෙම KE – 6357 දරණ ජීප් රථය පවරා ගැනීමේ කාර්ය සඳහා නොර්වීජියානු තානාපති කාර්යාලය වෙත ලිපි යොමු කළද මෙතෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත. මේ සම්බන්ධව විදේශ කටයුතු අමාත්‍යාංශයද දැනුවත් කර ඇති නමුත් පවරා දීම සම්බන්ධව මෙම ආයතන මඟින් අප වෙත කිසිදු පිළිතුරක් මෙතෙක් ලබා දී නොමැත.
07.	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු සංචිත වාහනවල මේ වන විට රාජ්‍ය ලාංඡනය පින්තාරු කර අවසන් කර ඇත.
08.	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2017, 2019, 2022, 2023, 2025 වර්ෂවල අපහරණ ක්‍රියාවලිය සිදුකර ඇති නමුත් මෙම අපහරණයට නියමිත වාහන වෙන්දේසියේදී නොවිකිණීම මත නැවත නැවත එම වාහන අපහරණ ලේඛනයට ඇතුළත්ව ඇති අතර මෙම වර්ෂය තුළ ද අපහරණය කිරීමට අදාළ වාහන ලේඛනය වත්කම් කළමණාකරන අංශය වෙත යොමුකර ඇත. ඒ අනුව මෙම සමහර වාහන ගර්හිත වී වසර 05ක් 06ක් ගත වී ඇතත් මෙතෙක් මෙම වාහන විකිණීමට නොහැකි වී ඇත.

09	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.	අක්‍රීයව පවතින බැංකු ගිණුම් නිරවුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
10	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මූ.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2023 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනයට අනුව සඳහන් කරන ලද හඳුනා නොගත් ගෙවීම් හා හඳුනා නොගත් ලැබීම් ගිණුම් අංක 7041283 දරණ ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ දක්වා ඇති හඳුනා නොගත් තැම්පතු 2 ක හැර අනෙක් ගිණුම් වලට අදාළ හඳුනා නොගත් ගෙවීම් හා හඳුනා නොගත් ලැබීම් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර ඇත. ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය අක්‍රීය තත්වයේ පවතින හෙයින් එම ගිණුම වසා දැමීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. ඉදිරියේදී මෙවන් තත්ත්වයන් නැවත ඇතිවීම් වැළැක්වීම සඳහා බැංකු සැසඳුම් මඟින් හඳුනා ගනු ලබන මෙවැනි ගනුදෙනු සම්බන්ධයෙන් මූ.රෙ. ප්‍රකාරව කටයුතු කිරීම සඳහා නිරන්තරයෙන් දැනුවත් කිරීම් කටයුතු සිදුකරනු ලබයි.
11	මූ.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇති කර නොගන්නා ලෙස ගෙවීම් ඒකක වෙත දැනුම් දී ඇත. Cigas වැඩසටහන යටතේ දක්වා ඇති මෙම සියළු බැරකම් නිරවුල් කර ඇතත් පද්ධතිය තුළින් ඉවත් නොකිරීම මත Cigas වැඩසටහන යටතේ මෙම බැරකම් පෙන්නුම් කරනු ලබයි. මේ වන විට මෙම සියළු බැරකම් Cigas වැඩසටහනින් ඉවත් කිරීමට ඉදිරි පියවර ගෙන ඇත.
12	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	මෙම අමාත්‍යාංශය මගින් සියලුම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, සියලුම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා මෙම අමාත්‍යාංශය යටතේ වන ආයතන, අංශ සඳහා පමණක් පුනරාවර්තන වැය විෂයන් යටතේ අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කරන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන නිදහස් කිරීමක් සිදු කරනු නොලබයි. තව ද වැය විෂයන් සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදනයන් නියමිත කාලය තුළ වෙන් කරන අතර නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන නිදහස් කිරීමක් සිදු කරනු නොලබයි.

13	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	එකඟ වෙමි. මෙම ණය ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර 2026.03.31 දිනට ණය ශේෂ නිරවුල් කර ගැනීමේ ප්‍රගතිය ඇමුණුම 01 සිට ඇමුණුම 10 දක්වා ඇත.
14	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023.12.31 දිනට පැවති වසර දෙක ඉක්මවූ රු. 465,967,142.29 තැන්පතු ගිණුම් ශේෂයෙන් රු.289,320,859.74 ක ප්‍රමාණයක් මේ වන විට නිරවුල් කර ඇත. මූ.රෙ 571 ප්‍රකාරව කටයුතු කරන ලෙස උප කාර්යාල දැනුවත් කර ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත. තැන්පතු ගිණුම් වල පවතින වසර 02 ට වැඩි තැන්පතු ශේෂ නිරවුල් කිරීමේ ප්‍රගතිය පිළිබඳව කාර්තු වශයෙන් උප කාර්යාල වෙතින් විමසීම සිදු කරයි. පොදු තැන්පත් ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මඟිනි. වසර දෙක ඉක්මවූ ශේෂ සම්බන්ධයෙන් මූ.රෙ. 571 අනුව කටයුතු කරන ලෙසත් පොදු තැන්පත් ගිණුම් හි පවතින ශේෂයන් වසර දෙක ඉක්මවීමට පෙර නිරවුල් කිරීමට කටයුතු කරන ලෙසත් නිරන්තරයෙන් උපදෙස් ලබා දී ඇත. කල් ඉකුත් වූ ශේෂ නිරවුල් කිරීමේ ප්‍රගතිය පිළිබඳව කාර්තු වශයෙන් උප කාර්යාල වෙතින් විමසීම සිදු කරයි. 2026.03.31 දින වන විට නිරවුල් කිරීමට පවතින ශේෂය රු. 204,607,009.81 ක් වේ. තවද මේ තුල පවතින ශිෂ්‍ය ඇප තැන්පතු මුදල් ගුරු සිසුන්ගේ උපාධි ප්‍රදානෝත්සවය පවත්වන තෙක් රඳවා ඇති අතර එම උත්සවයෙන් පසු නිරවුල් නොවූ ශේෂ පවතී නම් එය රජයේ ආදායමට බැර කිරීමට උපදෙස් ලබා දී ඇත.
15	මූ.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මසක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මූ.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මසක් ඇතුළත දී නිරවුල් නොකිරීම සම්බන්ධයෙන් විවිධ හේතූන් බලපා ඇති බව නිරීක්ෂණය වූ අතර, ඉදිරියේදී සිදු විය හැකි ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා අදාළ උපදෙස් ලබා දෙමින් සියලු අංශභාර ප්‍රධානීන් දැනුවත් කරන ලෙස දන්වා අතිරේක ලේකම්වරු වෙත ලිපියක් යොමු කළ අතර, මෙම ප්‍රමාදයන් අවම මට්ටමකට රැගෙන ඒම සඳහා අදාළ නිලධාරීන් තවදුරටත් දැනුවත් කිරීමට කටයුතු කරමි.

16	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	I) රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ගේ අංක PS/GT/2020 (III වෙළුම) හා 2022.01.03 දිනැති රැකියා විරහිත උපාධිධාරීන්/ ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන 2020 යටතේ බඳවාගත් පුහුණු අභ්‍යාසලාභීන් රාජ්‍ය සේවයේ තනතුරුවලට ස්ථීර පදනමින් පත්කිරීම මැයෙන් නිකුත් කරන ලද ලිපියේ පහත පරිදි උපදෙස් ලබා දී ඇත. • 04 ඡේදයේ V - සියලුම නිලධාරීන්/ අභ්‍යාසලාභීන් අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයේම රාජකාරි භාරගත යුතු වේ. • 06 ඡේදයේ V - ඒ අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙත අනුයුක්ත කර ඇති සියලු නිලධරයන්ට රාජකාරි භාරගැනීමට අවස්ථාව සලසා දීම ද, කිසිදු නිලධාරියකු අතිරික්ත නිලධාරීන් ලෙස සලකා කටයුතු නොකිරීම ද මැනවි. එබැවින් එම උපාධිධාරී අභ්‍යාසලාභීන්ට පුහුණුව සඳහා අනුයුක්ත කරන ලද සේවා ස්ථානයෙහිම ස්ථීර පත්වීම් ලබා දී ඇති අතර ඒ හේතුවෙන් ජාතික පාසල්වල සංවර්ධන නිලධාරීන් අතිරික්ත වී ඇත. II) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/CM/24/06 හා 2025.01.10 දිනැති ලිපිය අනුව අධ්‍යාපන අංශය වෙත සංවර්ධන නිලධාරී තනතුරු 461ක් අනුමත කර ඇති නමුත් තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව 453ක් වේ. ඒ අනුව මේ වන විටත් සංවර්ධන නිලධාරී තනතුරු 08 ක් පුරප්පාඩු වේ. III) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුව ප්‍රකාරව සංවර්ධන නිලධාරීන් ගුරු සේවයේ පවතින ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමෙන් අනතුරුව ජාතික පාසල්වල සේවයේ නියුතු අතිරික්ත සංවර්ධන නිලධාරීන් තුලනය කිරීමට අවශ්‍ය පියවර ගත හැක. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකාය යටතේ බහුකාර්ය සහයක පුහුණු නිලධාරීන් රාජ්‍ය අයතනයන්හි ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම යටතේ පහත පරිදි බඳවා ගෙන ඇත.

		<table><tr><td>තනතුර</td><td>2023 වර්ෂයේ ලබා දුන් පත්වීම් ගණන</td><td>2023 වර්ෂයේ පැවැති පුරප්පාඩු ගණන</td></tr><tr><td>කාර්ය සහායක</td><td>316</td><td>423</td></tr><tr><td>පාසල් ආරක්ෂක</td><td>192</td><td>473</td></tr><tr><td>සේවා සහයක සනීපාරක්ෂක</td><td>112</td><td>125</td></tr></table> ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 93/2021,476/2019,26/2022 සම්බන්ධව ලබාදී ඇති තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/02/03/01/2023 හා 2023.01.24 දිනැති ලිපිය ලද අනුමැතිය මත (2019.02.10 දින පවත්වන ලද ලිඛිත විභාගයේ ප්‍රතිඵල අනුව), 2021.06.30 දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පැවති පුරප්පාඩු ගණනය කර ඊට අදාළව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණිය සඳහා 2023.11.16 වන දින පත්වීම් ලබා දී ඇත. මෙම තනතුරු සංඛ්‍යාව ඉක්මවා බඳවාගෙන නැත. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සීමිත පදනම මත නිලධාරීන් 706ක් හා විවෘත පදනම මත නිලධාරීන් 384ක් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබූ අතර සීමිත පදනම මත වරින්වර බඳවාගෙන ඇති ප්‍රමාණය නිලධාරීන් 601ක් වේ. ඒ අනුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කර නොමැත. ඒ අනුව අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගින නොමැත.
17	2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	මේ වන විට සෑම කාර්තුවකටම වරක් අදාළ කාර්තුවල වාර්තා කඩිනමින් ශාඛා මඟින් එක් රැස් කර නිවැරදිව සාරාංශ කර පරීක්ෂා කිරීමෙන් අනතුරුව කඩිනමින් (උපරිම වශයෙන් රාජකාරී දින 30ක් ඇතුළත) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.
18	ආයතනයේ පවත්වාගෙන යන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ මේ වන විට ඒ සඳහා අවස්ථාව සලසා ඇත. වෙබ් අඩවියේ මුල් පිටුවෙහි “ඉක්මනින් බලන්න” යන ස්ථානයේ මහජන දුක්ගැනවිලි ලෙස ස්ථාපනය කර ඇත. තව දුරටත් “අප අමතන්න” මෙනුවෙහි අප හා සම්බන්ධ වීමට ලෙස පෝරමයක් සකසා ඇති බව දන්වා සිටිමි.

19	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ සියලුම අතිරේක ලේකම්වරුන් මෙන්ම ඒ හා සමාන නිලධාරීන් නිරතුරුවම දැනුවත් කර ඇත. තම අංශයට අදාළ සියලුම ශාඛාවල දැක්ම, මෙහෙවර මෙන්ම අදාළ විෂය පථයට අනුව කාර්යයන් ඉටුවීම ප්‍රදර්ශනය කර නොතිබීමේ අඩුපාඩු සම්බන්ධයෙන්ද බොහෝ අවස්ථාවලදී දැනුවත් කිරීම් සිදු කර ඇත. එමෙන්ම මේ සම්බන්ධයෙන් නැවත දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස 2026.07.02 දිනැතිව ලිපියක් සියලුම අතිරේක ලේකම්වරුන් මෙන්ම ඒ හා සමාන නිලධාරීන් වෙත යොමු කර ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට ඉහත ක්‍රමවේදය ගෙන ඇත.
20	සකස් කරන ලද මානව සම්පත් සැළසුම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2020 වසරේ සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ සෑම සේවාවක්ම ඇතුළත් වන පරිදි සැකසූ වැඩසටහනක් ඉදිරිපත් කර ඇත.
21	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විවෘත පදනම මත / සීමිත පදනම මත, කුසලතා පදනම මත 2023 වර්ෂයේදී කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොමැත. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ද 2023 වර්ෂයේදී කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොමැත. එබැවින් පුහුණු අවස්ථා ප්‍රමාණය අඩු වී ඇත.
22	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් වූ 1.6 ඡේදයේ කරුණු හැකි උපරිම අයුරින් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
23	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ සියළුම අංශ දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තරමක් සංකීර්ණ බැවින් ඒ සඳහා යම් කාලයක් ගතවේ. මේ වන විට හැකි උපරිම අයුරින් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

24	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ සියළුම අංශ දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. මෙම නියෝග ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තරමක් සංකීර්ණ බැවින් ඒ සඳහා යම් කාලයක් ගතවේ. මේ වන විට හැකි උපරිම අයුරින් නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර ඇත.
25	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් හා බැරකම් ප්‍රකාශ භාරදුන් බවට වන ලේඛනයෙහි 2023 වර්ෂයේ නිලධාරීන් 97 දෙනෙකු භාර දී ඇති බවට සඳහන්ව ඇත. 2023.06.30 වන විටත් වත්කම් හා බැරකම් ප්‍රකාශ භාර දී නොමැති නිලධාරීන් වේ නම් තම වත්කම් බැරකම් ප්‍රකාශ භාරදෙන ලෙස නිවේදන කිහිපයක් ලබා දී ඇත. 2024 වර්ෂයේ හා 2025 වර්ෂයේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැති නිලධාරීන්ගේ තොරතුරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත දන්වා යවා ඇති අතර 2025 වර්ෂයේ තම වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ එම එක් එක් නිලධාරියා වෙත වෙන වෙනම දුරකථනයෙන් හා ලිඛිතව අදාළ දැනුවත් කිරීම් සිදු කර ඇත. මේ වන විට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වන්නේ මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය හරහා පමණක් වන බැවින් ඒ සම්බන්ධව මෙම අමාත්‍යාංශය තුළ සේවයේ නියුතු සියළුම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සියළුම අතිරේක ලේකම්වරුන් වෙත අදාළ තොරතුරු ඇතුළත් ලිපියක් යොමු කර ඇත.
26	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ජාතික පාසල්, ගුරු විද්‍යාල හා විද්‍යාපීඨවල එකම සේවා ස්ථානයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ නාම ලේඛනය මාර්ගගතව වාර්ෂිකව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරනු ලබන අතර වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල වලදී ඒ පිළිබඳව සලකා බැලීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ලබයි. 2022.06.30 දිනට දීර්ඝ සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථාන මාරු කිරීමට අදාළ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලිය 2023.07.21 දින අවසන් කර තිබිණි. 2023.11.16 දිනැතිව ශ්‍රී ලං.වි.සේ. III වන ශ්‍රේණිය සඳහා වන නව බඳවා ගැනීමට පෙර පළාත් පාසල්වල සේවයේ නියුතුව සිටි ශ්‍රී ලං.වි.සේවයේ නිලධාරීන් ඒ වන විට පැවති ජාතික පාසල් පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීමට කටයුතු කිරීම හේතුවෙන් 2023 වර්ෂයේ නැවතත් වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලියක් සිදු කර නොමැත.

		ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් ස්ථාන මාරු කිරීමේදී විෂය අනුව ස්ථානමාරු කිරීම අසීරු කාර්යයක් වන අතර 2026 ස්ථානමාරු යටතේ එක් ස්ථානයක සේවා කාලය වසර 8ට වඩා වැඩි ස්ථාන මාරු කළ හැකි නිලධාරීන් ස්ථානමාරු කිරීමට පියවර ගෙන ඇත.

2026.07.30

ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය
ලේකම් (වැ.බ.)

ඇමුණුම 01

ලැබීමට ඇති ණය / අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය

රජයේ අමාත්‍යාංශවලට/දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු - ඇමුණුම 3.2

2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවිමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව						
			මාස 0-3	මාස 3-12	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20 ට වැඩි
		(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	60,389,983.35	4,280,558.05	7,146,885.94	4,868,447.28	2,914,097.23	11,857,986.54	22,338,658.36	6,983,349.95
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	53,077,321.66	2,275,194.00	4,163,942.49	4,789,020.88	2,697,933.80	10,427,115.43	19,594,822.32	9,129,292.74
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	60,587,035.01	4,835,503.72	9,587,560.89	4,400,088.09	3,512,845.34	11,924,137.87	16,287,567.18	10,039,331.92
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	6,263,217.64	1,461,160.00	2,210,024.10	626,626.54		554,194.00	1,411,213.00	
	2026.03.31 දිනට තවදුරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	54,323,817.37	3,374,343.72	7,377,536.79	3,773,461.55	3,512,845.34	11,369,943.87	14,876,354.18	10,039,331.92

ඇමුණුම 02

ලැබීමට ඇති ණය / අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය

පළාත් සභාවල ආයතනවලට මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු - ඇමුණුම 3.3

2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවීමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව						
			මාස 0-3	මාස 3-12	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20 ට වැඩි
		(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	21,033,993.17	1,726,701.00	2,522,960.00	2,703,478.78	707,484.42	4,101,579.23	4,762,859.50	4,508,930.24
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය-ශේෂය	23,714,177.27	2,277,465.74	5,286,596.00	2,081,357.39	410,693.42	4,073,591.25	4,863,735.45	4,720,738.02
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	37,695,577.05	20,252,722.81	2,345,311.50	1,336,145.26	538,710.42	4,020,220.83	4,066,693.45	5,135,772.78
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	5,369,995.10	4,610,531.60	740,453.50	8,750.00	10,260.00			
	2026.03.31 දිනට කවදුරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	32,325,581.95	15,642,191.21	1,604,858.00	1,327,395.26	528,450.42	4,020,220.83	4,066,693.45	5,135,772.78

ලැබීමට ඇති ණය / අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය

මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු - ඇමුණුම 3.4

2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවීමේ ප්‍රගතිය

විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව					
		වර්ෂ 1ට අඩු	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20ට වැඩි
	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)
2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	11,113,446.24	2,214,764.00	5,246,840.24	1,523,842.60	491,324.95	941,486.21	695,188.24
2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	9,085,998.71	3,265,992.34	3,122,933.00	791,125.58	1,258,779.55	94,830.00	552,338.24
2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	9,294,206.59	3,375,643.80	2,766,137.00	748,695.00	1,280,748.55	177,802.00	945,180.24
2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	361,875.60	3,750.00	196,625.00		161,500.60	-	
2026.03.31 දිනට තවදුරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	8,932,330.99	3,371,893.80	2,569,512.00	748,695.00	1,119,247.95	177,802.00	945,180.24

ඇමුණුම 04

ලැබීමට ඇති ණය / අක්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය

විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු - ඇමුණුම 3.5

2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවිමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව					
			වර්ෂ 1ට අඩු	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20 ට වැඩි
		(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	52,777,631.68	23,556,775.50	19,475,453.17	6,669,693.07	1,860,594.33	453,329.61	761,786.00
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	33,506,722.49	15,469,481.91	11,062,047.47	4,591,096.72	1,675,334.39	169,227.00	539,535.00
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	38,610,332.19	20,249,762.14	10,448,935.14	4,659,711.17	1,885,082.74	437,332.00	929,509.00
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	3,539,362.44	1,934,626.00	1,094,481.44	471,930.00	20,325.00	18,000.00	
	2026.03.31 දිනට තවදුරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	35,070,969.75	18,315,136.14	9,354,453.70	4,187,781.17	1,864,757.74	419,332.00	929,509.00

ඇමුණුම 05

ලැබීමට ඇති ණය / අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය
වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු - ඇමුණුම 3.6
2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවීමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව					
			වර්ෂ 1ට අඩු	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20 ට වැඩි
		(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	3,655,520.15	677,757.20	630,647.54	1,424,520.41	282,878.50	39,078.50	600,638.00
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	4,564,019.62	1,241,395.00	977,271.12	1,303,865.00	422,178.00	22,392.50	596,918.00
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	4,521,462.97	1,053,612.00	481,496.69	803,929.00	1,540,083.78	25,017.50	617,324.00
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	3,629.28				3,629.28		
	2026.03.31 දිනට තවදුරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	4,517,833.69	1,053,612.00	481,496.69	803,929.00	1,536,454.50	25,017.50	617,324.00

ඇමුණුම 06

ලැබීමට ඇති ණය / අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය

සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු - ඇමුණුම 3.7

2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවීමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව					
			වර්ෂ 1ට අඩු	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20 ට වැඩි
		(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	17,651,201.63	5,034,047.38	3,085,994.86	2,397,771.41	1,954,992.76	2,348,304.80	2,830,090.42
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	21,452,075.24	6,292,992.58	6,064,828.76	2,247,562.36	1,658,703.32	2,147,159.39	3,040,828.83
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	23,608,690.40	6,607,165.19	6,728,221.26	2,164,243.40	2,644,710.33	2,007,603.39	3,456,746.83
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	1,085,768.87	468,591.87	493,377.00	5,600.00	9,200.00	98,000.00	11,000.00
	2026.03.31 දිනට තවදුරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	22,522,921.53	6,138,573.32	6,234,844.26	2,158,643.40	2,635,510.33	1,909,603.39	3,445,746.83

ඇමුණුම 07

ලැබීමට ඇති ණය / අක්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය

වෙනත් - ඇමුණුම 3.8

2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවීමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව					
			වර්ෂ 1ට අඩු	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20 ට වැඩි
		(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	3,674,486.20	1,312,175.09	142,898.00	9,300.00	1,726,602.61	233,320.50	250,190.00
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	4,232,284.07	1,328,834.86	908,248.62	6,600.00	1,505,090.09	600.00	482,910.50
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	6,928,342.92	594,650.00	2,475,459.00	157,786.62	1,776,979.38	1,467,859.42	455,608.50
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	27,850.00	18,250.00	9,600.00				
	2026.03.31 දිනට තවදුරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	6,900,492.92	576,400.00	2,465,859.00	157,786.62	1,776,979.38	1,467,859.42	455,608.50

ඇමුණුම 08

ලැබීමට ඇති ණය / අත්කිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය

විවිධ රජයේ අමාත්‍යාංශවලට/දෙපාර්තමේන්තුවලට නිරවුල් කළ යුතු ශේෂ - ඇමුණුම 3.9

2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවීමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව						
			මාස 0-3	මාස 3-12	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20 ට වැඩි
		(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)	(රු)
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	32,544,703.74	1,815,886.80	7,235,105.84	1,705,866.84	1,593,857.88	4,476,369.93	7,753,981.93	7,963,634.52
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	24,156,678.69	1,554,594.20	3,038,548.78	952,395.36	642,418.88	1,253,071.43	10,496,358.52	6,219,291.52
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	33,949,289.92	3,253,212.00	11,509,589.00	1,478,488.10	677,593.88	1,362,374.43	8,633,500.99	7,034,531.52
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	2,105,668.88	385,356.00	1,689,512.88	30,800.00				
	2026.03.31 දිනට කවදාරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	31,843,621.04	2,867,856.00	9,820,076.12	1,447,688.10	677,593.88	1,362,374.43	8,633,500.99	7,034,531.52

ඇමුණුම 09

ලැබීමට ඇති ණය / අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය

පළාත් සභාවල ආයතනවලට නිරවුල් කළ යුතු ශේෂ - ඇමුණුම 3.10

2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවීමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය (රු)	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව						
			මාස 0-3 (රු)	මාස 3-12 (රු)	වර්ෂ 1-3 (රු)	වර්ෂ 3-5 (රු)	වර්ෂ 5-10 (රු)	වර්ෂ 10-20 (රු)	වර්ෂ 20 ට වැඩි (රු)
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	8,679,720.71	981,370.80	2,917,165.96	1,150,253.00	179,468.00	427,101.00	1,390,274.22	1,634,087.73
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	4,160,210.72	29,850.00	991,954.50	92,975.00	45,778.00	287,867.00	1,319,670.22	1,392,116.00
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	11,609,185.66	718,536.00	7,132,838.44	193,850.00	714,712.00	11,450.00	1,420,773.22	1,417,026.00
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	2,265,639.80	292,764.00	1,864,375.80		108,500.00			
	2026.03.31 දිනට කවදාවත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	9,343,545.86	425,772.00	5,268,462.64	193,850.00	606,212.00	11,450.00	1,420,773.22	1,417,026.00

ලැබීමට ඇති ණය / අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය
රජයේ නිලධාරීන්ගෙන් වැඩිපුර අයවීම - ඇමුණුම 3.11
2023.12.31, 2024.12.31 හා 2025.12.31 දිනට පැවති නිරවුල් කළ යුතු ශේෂයන්ගෙන් 2026.03.31 දිනට ණය අයවීමේ ප්‍රගතිය

	විස්තරය	ශේෂය	නිරවුල් වී ඇති ණය ශේෂය කාලය අනුව					
			වර්ෂ 1ට අඩු	වර්ෂ 1-3	වර්ෂ 3-5	වර්ෂ 5-10	වර්ෂ 10-20	වර්ෂ 20ට වැඩි
	2023.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	339,417.37	315,169.48	17,575.89	6,172.00		500.00	
	2024.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	501,459.36	158,405.60	69,753.52	162,153.24	83,275.00	27,872.00	
	2025.12.31 දිනට නිරවුල් කිරීමට තිබූ ණය ශේෂය	361,494.97	308,824.96	52,646.68	23.33			
	2026.03.31 දිනට නිරවුල් කරන ලද ණය ශේෂ ප්‍රමාණය	130,519.96	130,519.96					
	2026.03.31 දිනට තවදුරටත් නිරවුල් විය යුතු ණය ශේෂය (2025.12.31 දිනට පැවති ණය ශේෂයෙන්)	230,975.01	178,305.00	52,646.68	23.33	-	-	-